ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව
இலங்கை சட்ட உதவி ஆணைக்குழு
Legal Aid Commission of Sri Lanka

# පවුල හා බැඳි නීතිය (I කොටස)

## විවාහය සහ දික්කසාදය



USAID/CORE ව්‍යාපෘතියේ ආධාර මත සකසන ලදී

USAID
FROM THE AMERICAN PEOPLE

## වගකීමෙන් මිදීමේ ප්‍රකාශය

"අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු නියෝජිතායතනයේ (USAID) හරහා ලැබෙන ඇමරිකානු ජනතාවගේ පරිත්‍යාගශීලිත්වය මත මෙම ප්‍රකාශනය එළි දැක්වේ. මෙම වාර්තාවේ අන්තර්ගතය පිළිබඳ සම්පූර්ණ වගකීම ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව සතුවන අතර එමඟින් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු නියෝජිතායතනයෙහි (USAID) හෝ ඇමෙරිකානු එක්සත් ජනපද රජයේ මතය කිසිදු අයුරකින් පිළිබිඹු නොවන බව සැලකුව මැනව."

Ministry of Justice

# පවුල හා බැඳි නීතිය

## විවාහය සහ දික්කසාදය

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව**

සම්පාදනය
නීතිඥ දමයන්ති දිසානායක, LLB

*copyrights@ Legal Aid Commission of Sri Lanka*



# සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව (1978) අංක (27)දරණ පනත මඟින් ස්ථාපිත කරන ලදී. වරප්‍රසාද නොලත් ප්‍රජාවන්ට නොමිලේ නීතිමය උපදෙස් ලබාදෙන අරමුණින් ව්‍යාවස්ථාපිත නීති ආයතනයක් ලෙස කොමිසම මානව හිමිකම්, ළමා අයිතිවාසිකම්, කාන්තා අයිතිවාසිකම්, වැඩිහිටි අයිතිවාසිකම්, පවුල් නීතිය, කම්කරු නීතිය, වැනි ක්ෂේත්‍ර කිහිපයක නීතිමය සහය ලබාදෙයි. හැකිතාක් සිවිල් නීතියේ සහන සැලසීමට, දැනුවත් කිරීමට සහ මඟපෙන්වීම සඳහා අපගේ ආධාර පුළුල් කර ඇත්තෙමු.

අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන බොහෝ සංවිධාන තිබුනත්, ශ්‍රී ලංකා රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස නීතිමය කටයුතු කරගෙන යාමට නීතිමය බලය ඇති එකම ආයතනය නීති ආධාර කොමිෂන් සභාවයි.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව ආදායම, සමාජ තත්වය, ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය හෝ වයස නොසලකා උපදෙස් ලබා දෙයි. පීඩිත සහ අවදානමට ලක්ව ඇති දිවයින පුරා විසිරී සිටින දහස් ගනනකට නීතියේ පිහිට සමානව ලබාදීම ගැන අප ආඩම්බර වෙමු.

මෙම පොත් එකතුව ප්‍රජාවන්ට, නිලධාරින්ට සහ පුද්ගලයන්ට නීතිය අවබෝධ කර ගැනීමටත්, ඔවුන් ගේ අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳව දැනුවත් වීමටත් අත්වැලක් වේ. තව දුරටත් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ නිලධාරීන් මඟින් අවශ්‍ය නීතිමය සහය සහ උපදෙස් ලබා ගත හැකි බව දැනුවත් වීමට මෙය උපකාර වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

**ජනාධිපති නීතිඥ රොහාන් සහබන්දු**
සභාපති, ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

# ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව (1978) අංක (27) දරණ පනත මඟින් ස්ථාපිත කරන ලදී. එමඟින් අවදානමට ලක් විය හැකි, අඟහිඟකම් ඇති ප්‍රජාවන්ට, සමාජ තත්වයෙන් හෝ ආර්ථික තත්වයෙන් හෝ ස්ත්‍රී පුරුෂ භාවය අනුව යුක්තිය සඳහා ප්‍රවේශ වීම සීමා වී ඇති පුද්ගලයින්ට නීති ආධාර සැපයීම උදෙසා පිහිටුවන ලද්දකි.

තිරසාරභාවය හා ස්ථාවරත්වය උදෙසා නීතිමය ආධාර සපයන වෙනත් ආයතන හා සංවිධාන අතරින් මෙම කොමිසන් සභාව ප්‍රමුඛස්ථානයක් ගනී.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව දිවයින පුරා පළාත් 9 ක මධ්‍යස්ථාන 84 පවත්වා ගෙනයන අතර දැනුවත් කිරීම සහ ආදායම් සීමාවකින් තොරව සියලුම දෙනාට නීති උපදෙස් සම්පාදන ලබා දීම පිළිබඳව අවබෝධ කිරීම් සිදුකරයි. එහි ස්ථිර නීතිඥයින් 120ට අධික සංඛ්‍යාවක් සහ නිදහස් වෘත්තීක නීතිඥයන් 1000 ට අධික සංඛ්‍යාවක් කාර්යයේ නිරත වේ.

"කොමිෂන් සභාවේ දැක්ම වන්නේ සියලුම ශ්‍රී ලාංකිකයන්ට යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක් තිබිය යුතු සමාජයක් නිර්මාණය කිරීමයි." මෙම අරමුණ සාක්ෂාත්කර ගැනීම සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව බොහෝ ව්‍යාපෘති සිදුකර ඇත.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ මෙහෙවර වන්නේ රටේ නීතිමය පිහිට ලැබිය යුතු පුද්ගලයන්ට පිහිට ආධාර ලබාදීම බව පනතේ සඳහන් වේ.

# අපගේ දැක්ම

### යුක්තියට සම ප්‍රවේශයක්

ශ්‍රී ලාංකිකයින්ට ඔවුන්ගේ ආර්ථික හෝ සමාජ තත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, කුලය, ආගම හෝ ජාතිකත්වය හෝ ආබාධිතභාවය නොසලකා යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක් ඇති සමාජයක් නිර්මාණය කිරීමයි.

# පටුන


පිටු අංක

| | |
|---|---|
| පවුල සම්බන්ධ නීති කවරේද ? | 01 |
| විවාහය | 02 |
| සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ විවාහයක් ලියාපදිංචි කරන්නේ කෙසේද ? | 03 |
| විවාහය නීත්‍යානුකූලව ලියාපදිංචි කරන්නේ කෙසේද ? | 04 |
| උඩරට නීතියේ දීග සහ බින්න විවාහවල වෙනස කුමක්ද ? | 05 |
| චාරිත්‍රානුකූල විවාහය | 06 |
| විවාහ වීමේදී තහනම් නෑකම් මොනවාද ? | 07 |
| විවාහයක් අවලංගු වෙන අවස්ථා මොනවාද ? | 08 |
| විවාහය අවසන් කරන්නේ කෙසේද ? | 09 |
| විවාහයක් ශූන්‍ය හා බල රහිත කරන්නේ කෙසේ ද ? | 10 |
| දික්කසාද නඩු | 11 |
| ද්වේශ සහගත හැරයාම යනු කුමක් ද? | 12 |
| සැකය නිසා බිරිඳ විසින් ස්වාමි පුරුෂයා හැරගිය විට කුමක් සිදුවේද? | 14 |
| අඹුසැමියන් දෙදෙනා වෙන් වෙන් වෛවාහක වැරදි දෙකක් කර ඇතවිට තත්ත්වය කුමක්ද ? | 15 |
| ලිංගික බෙලහීනත්වය | 16 |
| දෙදෙනාගේ කැමැත්ත මත දික්කසාදයක් ලබා ගැනීම | 17 |
| දික්කසාද දීමනා | 18 |
| මුස්ලිම් නීතිය යටතේ දික්කසාද | 20 |
| LAC මධ්‍යස්ථාන පිහිටි ස්ථාන | 22 |



## පවුල සම්බන්ධ නීති කවරේද?

"පවුල හා එයට අදාල නීති පිළිබඳව සළකා බැලීමේදී විවාහය සහ දික්කසාදය. නඩත්තු, දරුවන්ගේ භාරකාරත්වය, කුළ වද්දා ගැනීම ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය යනාදිය වැදගත් වේ."

## ශ්‍රී ලංකාවේ නීතිය අනුව වලංගු විවාහයක් කරගත හැකි ක්‍රම මොනවාද ?

පහත සඳහන් එක් ආකාරයකින් වලංගු විවාහයක් කරගත හැකිය.

- සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ විවාහ වීම.
- උඩරට නීතිය යටතේ විවාහ වීම.
- මුස්ලිම් නීතිය යටතේ විවාහ වීම.
- ප්‍රසිද්ධයේ අඹුසැමියන් ලෙස ජීවත් වීම නිසා විවාහය පිළිගැනීම.
- චාරිත්‍රානුකූලව සිදුකෙරෙන විවාහ.



## සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ විවාහයක් ලියාපදිංචි කරන්නේ කෙසේද ?

සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ විවාහ ලේකම්වරයෙකු හෝ ක්‍රිස්තියානි පූජකවරයෙකු විසින් විවාහයක් ලියාපදිංචි කරනු ලැබේ. මෙහිදී සාක්ෂිකරුවන් දෙදෙනෙකුද මෙම විවාහයට අත්සන් කරනු ලැබේ. මේ සඳහා නියමිත කාර්‍ය පටිපාටිය නම් විවාහ වීමට අපේක්ෂිත පාර්ශවයන් පළමුව විවාහ ලේකම්වරයා වෙත විවාහය පිළබඳ දැන්වීමක් බාරදිය යුතුය. එම දැන්වීම ලැබුණු පසු විවාහ ලේකම්වරයා එම විවාහය දැන්වීම් පොතේ ඇතුළත් කළ යුතුය. ඉන්පසු දින 12ක් එම දැන්වීම තමාගේ කාර්යාලයේ ප්‍රසිද්ධ කළ යුතුය.

## විවාහයට විරෝධය දැක්විය හැකිද ?

ඔව්.

- එම කාලය තුළ බාලවයස්කාරයකු සම්බන්ධයෙන් විවාහයක් නම් ඒකී බාලවයස්කාර භාරකරුට විරෝධතා ඉදිරිපත් කළ හැකිය.
- ඒ හැර එම කාලය තුළ වෙනත් විරෝධතා කේවියට් තහනමක් මඟින් ඉදිරිපත් කළ හැකිය. එවැනි අවස්ථාවක දී විවාහ ලේකම්වරයා විසින් එම විරෝධතාව දිසා අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

## විවාහ සහතික නිකුත් කරන්නේ කවදාද ?

දින 12ක් විවාහ දැන්වීම ප්‍රදර්ශනය කළ පසු විරෝධතාවයක් නොමැති නම් විවාහ ලේකම්වරයා විසින් විවාහ දැන්වීම දුන් තැනැත්තාට විවාහ ලේකම්වරයාගේ සහතිකය නිකුත් කරනු ලැබේ.

විරෝධතාවයන් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් එවිට ද විවාහ දැන්වීම දුන් තැනැත්තාට සහතිකය නිකුත් කරනු ලැබේ.

## විවාහය නීත්‍යානුකූලව ලියාපදිංචි කරන්නේ කෙසේද ?

විවාහ ලේකම්වරයා විසින් සහතිකය ඉදිරිපත් කළ විට විවාහය ලියාපදිංචි කළ හැකිය.

විවාහ ලේකම්වරයා විසින් ස්වකීය කාර්යාලයේ දී හෝ වෙනත් බලයලත් ස්ථානයක දී විවාහයක් ලියාපදිංචි කරනු ලැබේ.

ක්‍රිස්තියානි විවාහයක දී පල්ලියේ චාරිත්‍ර අවසන් වීමෙන් පසුව පූජකවරයා පල්ලියේ ඇති විවාහ ලේඛනයේ විවාහය ලියාපදිංචි කරයි. එම සටහනේ අනු පිටපතක් විවාහ ලේකම්වරයා වෙත යවනු ලැබේ. විවාහ ලේකම්වරයා එම සටහන ඔහුගේ ලේඛණයේ සටහන් කරයි.

## විශේෂ බලපත්‍රයක් මත විවාහ වීම

මෙහිදී දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාගේ විශේෂ අවසරයක් මත විවාහයක් ලියාපදිංචි කළ හැක. මෙහිදී දින 14කට පෙර දැන්වීම් භාර දීම අවශ්‍ය නොවේ.

## උඩරට නීතිය යටතේ විවාහ වීම

1952 අංක 44 දරණ උඩරට විවාහ සහ දික්කසාද පනතේ උඩරට විවාහ සහ දික්කසාද වලට අදාල නීතිය අන්තර්ගත කොට ඇත. වර්තමානයේ උඩරට විවාහයක් ලියාපදිංචි කළ හැක්කේ උඩරට ප්‍රදේශ තුළ පමණකි. උඩරට වැසියකුට උඩරට නීතිය යටතේ හෝ සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ විවාහ විය හැකිය.

උඩරට නීතියේ දීග හා බින්න වශයෙන් විවාහ වර්ග 2ක් ඇත. විවාහය ලියාපදිංචි කිරීමේ දී එය දීග විවාහයක් ද නැතිනම් බින්න විවාහයක් ද යන්න සටහන් කෙරේ.

## උඩරට නීතියේ දීග සහ බින්න විවාහවල වෙනස කුමක්ද ?

දීග විවාහය - දීග විවාහයක දී සැමියා තම නිවසට බිරිඳ කැඳවාගෙන යයි. සැමියාගේ නිවසේ වෛවාහ නිවස පිහිටුවා ගනී.

මෙහිදී බිරිඳ ගෙන ආ දැවැද්ද සම්බන්ධයෙන් හෝ විවාහයෙන් පසුව ඇය විසින් ස්වාධීනව උපයා ගත් දේ සම්බන්ධයෙන් සැමියාට බලයක් නැත. එහෙත් සැමියා මිය ගියහොත් පවුලේ යහපත හා නඩත්තුව සඳහා සැමියාගේ දේපළ පාවිච්චි කිරීමේ හෝ පාලනය කිරීමේ බලය බිරිඳට ඇත.

බින්න විවාහය - බින්න විවාහයක දී සැමියා බිරිඳගේ නිවසේහි පදිංචි වෙයි. මෙවැනි විවාහ සිදු කරනු ලබන්නේ පුතුන් අඩු හා දේපළ හිමි පවුල්වල දේපළ පිට යෑම වළක්වා ගැනීම සඳහා වේ.

මෙහිදී බිරිඳගේ නිවස තුළ සැමියාට කිසඳු වරප්‍රසාදයක් හිමි නොවේ. සාමාන්‍ය ජන ව්‍යවහාරයේ බින්න විවාහයකට එළැඹි සැමියා "තල් අත්තක් හා හුලු අත්තක් ළඟ" තබා ගත යුතු බව පවසා ඇත්තේ ඕනෑම වේලාවක බිරිඳට හෝ ඇයගේ දෙමාපියන්ට ඔහුව නිවසින් නෙරපා දැමීමට හැකි බැවිනි.

### මුස්ලිම් ක්‍රමයට විවායක් සිදු කරගන්නේ කෙසේද ?

ඉස්ලාම් ආගම අදහන අය අතර සිදුවන විවාහ මුස්ලිම් විවාහ ලෙස හඳුන්වනු ලැබේ. 1951 අංක 13 දරණ මුස්ලිම් විවාහ සහ දික්කසාද ආඥා පනතට අනුව මුස්ලිම් විවාහයක් අනිවාර්යයෙන්ම ලියාපදිචි කළ යුතුය. එය කාති විසින් සිදු කරනු ලැබේ. විවාහය ලියාපදිංචි කිරීමට ප්‍රථම නිකා නැමැති චාරිත්‍රය ඉටු කරනු ලැබේ.

මුස්ලිම් නීතිය යටතේ මුස්ලිම් ජාතික පුරුෂයෙකුට විවාහ 4ක් කරගත හැකිය. එම වරප්‍රසාදය භුක්ති විඳිය හැක්කේ භාර්යාවන් හතර දෙනාටම ප්‍රමාණවත් ලෙස යුතුකම් ඉටුකළ හැකිනම් පමණි. නමුත්, මුස්ලිම් කාන්තාවකට කර ගත හැක්කේ එක් විවාහයක් පමණක් වන අතර එයද මුස්ලිම් ජාතිකයෙකු සමඟ පමණි. නමුත් මුස්ලිම් ජාතික පුරුෂයෙකුට වෙනත් නිකායක මුස්ලිම් කාන්තාවක සමඟද විවාහ විය හැක.

තවද මුස්ලිම් නීතිය යටතේ ලේ ඥාතීන් අතරත්, හදාවඩාගත් ඥාතීන් අතරත් විවාහ තහනම්ය.

එමෙන්ම විවාහයේදී මනාළයාගේ පාර්ශවය විසින් මනාළියට මහාර් නැමැති දෑවැද්දක් දෙනු ලැබේ.

## බෞද්ධ චාරිත්‍රානුකූල විවාහය

සිංහල බෞද්ධයන් අතර පෝරුවේ චාරිත්‍රය පිළිගත් විවාහ චාරිත්‍රයකි.

තේසවලාමේ නීතියට අනුව විවාහ වීම පාලනය වන ද්‍රවිඩ ජාතිකයන් අතර මනාලියගේ බෙල්ලේ තාලියක් බැඳීමත්, කාලම් හෙවත් බත් කැවීමේ මංගල්‍යයත් පිළිගත් චාරිත්‍ර ලෙස සැලකේ.

තවත් වැදගත් කරුණක් සඳහන් කළ යුතුය. චාරිත්‍රානුකූල විවාහ පහත රට සිංහලයන් සහ ද්‍රවිඩ ජනයා අතර නීත්‍යානුකූල වුවත් උඩරට නීතිය යටතේ හෝ මුස්ලිම් නීතිය යටතේ පිළිගනු නොලැබේ.

## වාසයෙන් සහ සංවාසයෙන් ඇති වන විවාහ

විවාහයක් ලියාපදිංචි කර නැතත් පිළිගත් චාරිත්‍රානුකූලව විවාහ උත්සවයක් පවත්වා ඉන්පසු අඹුසැමියන් ලෙස ජීවත් වූ පුරුෂයකු හා ස්ත්‍රිය අතර වලංගු විවාහයක් ඇතැයි පිළිගැනේ.

අපේ පැරැන්නන්ට විවාහයක් ලියාපදිංචි කිරීමට ප්‍රමාණවත් පහසුකම් හෝ අවබෝධයක් නොවීය. එහෙත් ඔහුන්ට යහපත් විවාහ ජීවිතයක් ගත කිරීමට මනා හැකියාවක් තිබූ බව අපි දනිමු.

එවැනි අඹු සැමියන්ගේ දේපල උරුම වීම වැනි ගැටළු පැන නැගුනු අවස්ථා වලදී හැසිරීමෙන් හා ප්‍රසිද්ධියෙන් ඇති වූ විවාහයන් පවතින බව අධිකරණය තීන්දු කර ඇත.

මෙවැනි විවාහයක් පිළිගැනීම කොන්දේසි වලට යටත්ව සිදු කර ඇත. එලෙස චාරිත්‍රානුකූලව විවාහ උත්සවයන් පවත්වා අඹුසැමියන් ලෙස ජීවත් වූ දෙදෙනාට තම විවාහය පසුව ලියාපදිංචි කිරීමටද හැක.

## විවාහ අවලංගු වන අවස්ථා මොනවාද ?

වයස අවුරුදු 18ට අඩු දෙදෙනකු අතර සිදුවන විවාහය අවලංගුය.

තහනම් ඥාතී සබඳතා සහිත පුද්ගලයින් අතර ඇති වන විවාහ අවලංගුය.

## විවාහ වීමේදී තහනම් නෑකම් මොනවාද ?

පහත සඳහන් අය අතර සිදුවන විවාහ අවලංගුය.
එක් පාර්ශ්වයක් අනෙක් පාර්ශ්වයෙන් කෙලින්ම පැවැතෙන්නෙකු වන විට උදාහරණයක් ලෙස පියා සහ දුව අතර විවාහයට ඉඩ නැත.

**පුරුෂයන්ට අදාලව**

- පුරුෂයාගේ සහෝදරියක වන විට
- පුරුෂයාගේ සහෝදරයාගේ හෝ සහෝදරියගේ දියණියක වන විට
- පුරුෂයාගේ භාර්යාවට වෙනත් පියෙකු නිසා ලත් දියණියක වන විට
- තම පුතාගේ හෝ මුණුපුරාගේ හෝ පියාගේ හෝ සීයාගේ වැන්දඹුව වන විට

**ස්ත්‍රීන්ට අදාලව**

- ස්ත්‍රියකගේ සහෝදරයෙකු වන විට
- ස්ත්‍රියගේ සහෝදරයාගේ හෝ සහෝදරියගේ පුතෙකු වන විට
- ස්ත්‍රියගේ ස්වාමි පුරුෂයාගේ වෙනත් ස්ත්‍රියක් නිසා ලද දරුවකු වන විට
- ස්ත්‍රියගේ මියගිය දියණියගේ හෝ මියගිය මිණිපිරියගේ හෝ මියගිය මවගේ හෝ මිය ගිය මිත්තනියගේ ස්වාමි පුරුෂයා වන විට

ඉහත සඳහන් සහෝදරයා හෝ සහෝදරිය යන්නට තම පියාගේ වෙනත් විවාහයක දරුවන්ටද තම මවගේ වෙනත් විවාහයක දරුවන්ද ඇතුළත්ය. තහනම් ඥාතීත්ව ඇති අය විවාහ වූ විට එම විවාහ අවලංගු වෙනවා පමණක් නොව ඔවුනට නඩු පවරා සිර දඬුවම් නියම කිරීමටද පුළුවන,

## බිරිඳ / සැමියා අත හැර දමා විදේශ රටකට ගොස් හෝ ආගිය අතක් නොමැතිව වසර ගනනාවක් ඇය/ඔහු ගැන තොරතුරක් නැති විට සැමියාට / බිරිඳට නැවත විවාහ විය හැකිද ?

වලංගු විවාහයක් පවතින විට තවත් විවාහයක් කරගත නොහැකියි. එය දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරදකි.

එහෙත් සැමියා හෝ බිරිඳ අවුරුදු 7ක් වෙන්වී සිට එකී කාලසීමව තුල එක් පක්ෂයක් ජිවත්ව සිටින බවට තොරතුරක් නොලැබුණ විට ඔහු හෝ ඇය මිය ගිය බවට දිසා අධිකරණයෙන් ප්‍රකාශයක් ලබා ගෙන නැවත වෙනත් විවාහයකට ඇතුලත් වීමට හැක.

කෙසේ නමුත් සැමියා හෝ බිරිඳ අවුරුදු 7ක් වෙන්වී සිටින අවස්ථාවක දී ලඝු කාර්‍ය පාටිපාටිය යටතේ නඩුවක් පවරා ඉක්මණින් දික්--කසාදයක් ලබගැනීමද කළ හැක.

## විවාහයක් අවලංගු වෙන වෙනත් අවස්ථා මොනවාද ?

සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනත අනුව පහත සඳහන් අවස්ථාවල ද විවාහයක් අවලංගු වේ.

විවාහයක් ලියාපදිංචි කිරීමට බලය නැති පුද්ගලයකු විවාහය ලියාපදිංචි කළ විට

විවාහයක් ලියාපදිංචි කිරීමට බලය නැති ස්ථානයක දී ලියාපදිංචි කළ විට

නිවැරදි දැන්වීමේ සහතිකය ලබා නොගෙන විවාහය ලියාපදිංචි කළ විට

වැරදි නමකින් විවාහය ලියාපදිංචි කළ විට

**කසාද සහතිකයක් ලබාගත හැක්කේ විවාහයේ පාර්ශ්වකරුවන්ට පමණක් ද ?**

නැත. එය ප්‍රසිද්ධ ලියවිල්ලක් නිසා අදාල රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලුම් කර ඕනෑම කෙනෙකුට ලබාගත හැකිය.

**විවාහයක් වැරදි සහගතව ලියාපදිංචි කර තිබුනොත් හෝ විවාහය ලිංයාපදිංචි කිරීම මඟහැරී තිබුනොත් ගත හැකි පියවර කුමක්ද ?**

පාර්ශවකරුවන්ගේ වැරැද්දකින් තොරව එම වරද සිදු වී ඇත්නම් ප්‍රතිකර්ම තිබේ. ඒය යතුරු ලියන දෝෂයක් නම් රෙජිස්ට්‍රාර් ජෙනරාල්ට නිවැරදි කළ හැකිය. එසේ නොවන වරදක් නම් පාර්ශ්වකරුවන් දිසා අධිකරණය වෙත ඉල්ලීමක් කළ යුතුය.

## විවාහය අවසන් කරන්නේ කෙසේද ?

විවාහයක් අවසන් කිරීම සඳහා ශ්‍රී ලංකා නීතිය යටතේ නඩු වර්ග 3ක් ඇත, එනම්

- විවාහය ශූන්‍ය හා  බල රහිත කිරීම.
- දික්කසාද නඩු.
- වාසයෙන් හා සංවාසයෙන් වෙන්වීම සඳහා නඩු.

මෙයට අමරතව සැමියාගේ හෝ බිරිඳගේ මරණයෙන් විවාහය ස්වභාවිකව අවසන් වේ.



# විවාහයක් ශූනය හා බල රහිත කරන්නේ කෙසේ ද ?

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 607 වන වගන්තිය යටතේ විවාහයක් ශූන්‍ය හා බලරහිත කරන ලෙස ඉල්ලා ස්වාමි පුරුෂයකුට හෝ භාර්යාවකට නඩුවක් පැවරිය හැක.

- විවාහ වීමට අවශ්‍ය සුදුසුකම් නැති දෙදෙනෙකු අතර සිදු කරන විවාහයන් ද,
- අවශ්‍ය සුදුසුකම් සපුරන්නේ නැතිව කරන විවාහයන් ද, ශූන්‍ය හා බල රහිත වේ.
- බහු විවාහයන් ද මුල පටන්ම අවලංගුවේ. එනම් විවාහක පුරුෂයකු හෝ බිරිඳ විවාහකයෙකු වීම හා එම විවාහයෙන් නීත්‍යානුකූලව වෙන් නොවී නව විවාහයකට ඇතුලත්වීම බහු විවාහයක් වේ.
- විවාහයකට එළඹීමේදී පාර්ශවකරුවන්ගේ නිදහස් කැමැත්ත තිබිය යුතුය. නිති විරෝධි බල කිරීම, වංචාව, සිහිවිකල්කත්වය, අනන්‍යතාව පිළිබඳ වරද යන කරුණු ඇතිවිට නිදහස් කැමැත්තක් නැත.
- වංචාවක් ඇති නිසා විවාහයක්ද ශූන්‍ය හා බල රහිත කිරීමට ඉල්ලා සිටිය හැකිය. විසි වන වියේ පසුවන තරුණයෙකුට දරුවන් සිටින වැන්දඹු කාන්තාවක් නව යොවුන් වියේ පසුවන කාන්‍යාවක ලෙස හඳුන්වා විවාහ කර දුන් අවස්ථාවක වංචාවක් ඇති නිසා විවාහය ශූන්‍ය හා බල රහිත කිරීමට ඉල්ලා සිටිය හැකිය.
- නීති විරෝධී බල කිරීම නිසා විවාහ වීමට නිදහස් කැමැත්ත නොමති නිසා අධිකරණය වෙත ගොස් විවාහය අවලංගු කර ගත හැකිය.
- අනන්‍යතාව ගැන වැරදීමක් ඇති නිසා විවාහය ශූන්‍ය හා බල රහිත කරන ලෙස ඉල්ලා සිටිය හැකිය. විවාහ වීමට කැමැත්ත දුන් අය නොමැතිව වෙනත් අයෙකුට වංචනිකව විවාහ කර දීම අනන්‍යතාව ගැන වැරදීමක් ඇති විවාහයකි.
- විවාහ කර ගන්නා තරුණිය කන්‍යාවක් අවස්ථාවක විවාහය ශූන්‍ය හා බල රහිත කරවා ගත නොහැක.
- විවාහ වෙන අවස්ථාවේ භාර්යාව ගැබ් ගෙන සිටි නම් සහ එසේ ගැබ් ගෙන සිටින්නේ වෙනත් පුරුෂයෙකු නිසානම් හා ඇය ගැබ්ගෙන සිටින බව පුරුෂයා දැන නොසිටියේ නම් විවාහය බල රහිත කරවා ගත හැකිය.

පහත සඳහන් අවස්ථා වලදී වලංගු විවාහයක් ඇති නොවන බව අප සඳහන් කර ඇත.

- සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ නියම කළ ස්ථානයක සිදු නොකරන ලද විවාහ
- වැරදි නම් වලින් කරන ලද විවාහ
- නියමිත ආකාරයට විවාහ ලේකම්වරයාගේ සහතිකයක් නැතිව කරන ලද විවාහ
- නීතියෙන් බලය නැති අයෙකු විසින් ලියාපදිංචි කරන ලද විවාහ

## දික්කසාද නඩු

නීත්‍යානුකූලව විවාහ වී ඇති අඹු සැමි දෙපලක් අතර පවතින විවාහයක් අවලංගු කරවා ගැනීම සඳහා දික්කසාද නඩුවක් පැවරිය යුතුය.

## දික්කසාද නඩුවක් පැවරිය හැක්කේ කුමන උසාවියේ ද?

බිරිඳ හෝ ස්වාමි පුරුෂයා පදිංචි ප්‍රදේශයට අයත් වන දිසා අධිකරණයේ දික්කසාද නඩුවක් පැවරිය හැකිය.

නඩු නිමිත්ත උපචය වූ ප්‍රදේශය අයත් වන දිසා අධිකරණයේ ද දික්කසාද නඩුවක් පැවරිය හැකිය.

## වෛවාහක වැරදි යනු මොනවා ද?

සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 19 වන වගන්තිය අනුව වෛවාහක වැරදි 3ක් ඇත.

1. විවාහයෙන් පසු සිදුකල අනාචාරය
2. ද්වේශ සහගත හැරයාම
3. විවාහ වන අවස්ථාවේ තිබූ සුව කළ නොහැකි ලිංගික බෙලහීනතාව

දික්කසාදයක් ඉල්ලා සිටින ස්වාමි පුරුෂයා හෝ භාර්යාව එම වැරදි තුනෙන් එකක් හෝ කීපයක් සිදුකර ඇති බව ඔප්පු කළ යුතුය.

## ද්වේශ සහගත හැරයාම යනු කුමක් ද?

මෙම වැරදි සම්පූර්ණ වීමට නම් පහත සඳහන් කරුණු දෙකම එක්විය යුතුය.

විවාහය අවසන් කිරීමේ චේතනාව.

අඹුසැමි දෙදෙනාගෙන් එක් පක්ෂයක් අනෙක් පක්ෂය හැරයාම ද්වේශ සහගත හැරයාමයි

පහත සඳහන් එක් ආකාරයටක සිදුවිය හැකිය.

නියම ද්වේශ සහගත හැරයාම

අනුමිත ද්වේශ සහගත හැරයාම

### නියම ද්වේශ සහගත හැරයාම යනු කුමක් ද?

මෙහිදී භාර්යාව හෝ ස්වාමි පුරුෂයා විවාහය අවසන් කිරීමේ චේතනාවෙන් වෛවාහක නිවස හැර යයි. එසේ හැර යාම සිදු කරන්නා ද්වේශ සහගත හැරයාමේ වරද සිදු කරයි. එවැනි අවස්ථාවක අහිංසක පක්ෂයට අනෙක් පක්ෂයේ ද්වේශ සහගත හැරයාම මත දික්කසාද නඩු තීන්දුවක් ලබාගත හැකිය.

### අනුමිත ද්වේශ සහගත හැරයාම යනු කුමක් ද?

මෙහිදී භාර්යාව හෝ ස්වාමි පුරුෂයා විසින් අනෙක් පක්ෂයේ ක්‍රියා කලාපය ඉවසා සිටිය නොහැකි නිසා වෛවාහක නිවස හැර යයිද එහිදී නිවස හැරයන අයට විවාහය අවසන් කිරීමේ චේතනාවක් නැත. මෙහිදී වෛවාහක වරද සිදු කරන්නේ නිවසේ රැඳී සිටිමින් ද්වේශ සහගත කටයුතු කරන පක්ෂය වේ. එවැනි අවස්ථාවක එකී පක්ෂය අනුමිත ද්වේශ සහගත හැරයාම වෛවාහක වරද සිදු කරයි. අහිංසක පක්ෂයට අධිකරණය වෙත ගොස් ඒ හේතුව මත දික්කසාද නඩු තීන්දුවක් ලබාගත හැකිය.

## ද්වේශ සහගත හැරයාම සිදුවීමට භාර්යාව හෝ ස්වාමි පුරුෂයා වෛවාහක නිවස හැරයා යුතුම ද?

මින් අදහස් කරන්නේ ස්ථානයකින් වෙනස්වීමක් පමණක් නොවේ. එය තත්වයකින් වෙනස් වීමක්විය හැකිය. භාර්යාව සහ ස්වාමි පුරුෂයා එකම ගෙදරක වාසය කළත් දෙදෙනා වෙන් වෙන් කාමරවල වෙනම කෑම පිසගෙන, සංවාසයෙන් නොයෙදී ජීවත්වූ අවස්ථාවක ද්වේශ සහගත හැරයාමක් ඇති බව අධිකරණය විසින් තීරණයකර ඇත.

**භාර්‍යාව, ස්වාමිපුරුෂයා සමඟ මෛථුන සේවනයේ යෙදීම ප්‍රතික්ෂේප කිරීම ද්වේශසහගත හැරයාමක් ද?**

ඔව්. වෛවාහක වරප්‍රසාද ප්‍රතික්ෂේප කිරීම ද්වේශසහගත හැරයාමක් සංවාසයේ යෙදීම වෛවාහක වරප්‍රසාදයක් වන බැවින් භාර්‍යාව හෝ ස්වාමි පුරුෂයා සාධාරණ හේතුවක් නැතිව එය ප්‍රතික්ෂේප කරන අවස්ථාවක ද්වේශසහගත හැරයාම මත අහිංසක පක්ෂයට දික්කසාදයක් ඉල්ලා සිටිය හැකිය.

**බිරිඳ නැන්දම්මා සමග දබර වී ඇගේ දෙමාපියන් පදිංචි නිවසේ වාසය කිරීම පිණිස ගිය අවස්ථාවක ද්වේශ සහතග හැරයාමක් තිබේ ද?**

බොහෝ පවුල්වල නැන්දම්මා සහ ලේලිය අතර ආරවුල් හට ගනී. මෙහිදී විවාහය කඩාකප්පල් කිරීමේ චේතනාවක් බිරිඳ තුළ නැති නිසා ද්වේශ සහගත හැරයාමක් ද නැත. ද්වේශ සහගත හැරයාම මත දික්කසායක් ඉල්ලා සැමියා විසින් පවරන ලද දික්කසාද නඩුව අධිකරණය විසින් නිෂ්ප්‍රභාකරන ලදී.

**ස්ත්‍රියකු හා පුරුෂයකු අතර විවාහය ලියාපදිංචි කිරීමෙන් පසුව ස්වාමි පුරුෂයා, භාර්යාව කැටුව යාම ප්‍රතික්ෂේප කළවිට තත්වය කුමක්ද ?**

මෙහිදී ද්වේශසහගත හැරයාම මත දික්කසාදයක් ලබාගත හැකිය.

**විවාහය පරිපූර්ණ කිරීම යනු කුමක් ද?**

විවාහය ලියාපදිංචි කිරීමෙන් පසු විවාහය පරිපූර්ණ වන්නේ අඹුසැමියන් ලෙස සංසර්ගයේ යෙදීමෙන්ය.

**සැමියා බිරිඳට කෲර ලෙස සැලකීම ද්වේශ සහගත හැරයාමක් ලෙස සැලකිය හැකි ද?**

සැමියාගේ අධික කෲරකම ඉවසා සිටිය නොහැකිව බිරිඳ වෛවාහක නිවසෙන් පිට වී යන අවස්ථාවකදී සැමියාගේ අනුමිත ද්වේෂ සහගත හැරයාම මත බිරිඳට දික්කසාදයක් ලබා ගත හැකිය.

## සැකය නිසා බිරිඳ විසින් ස්වාමි පුරුෂයා හැරගිය විට කුමක් සිදුවේද?

අඹුසැමියන් එකිනෙකා සැක කිරීම නිසා නිතර ඔවුන් අතර ආරවුල් ඇතිවේ.

එවැනි අවස්ථාවක දී බිරිඳ සැමියා හැර යන්නේ විවාහය අවසන් කිරීමේ චේතනාවෙන් නොවන නිසා වෛවාහක වරදක් සිදු නොකරයි.

" ද මැල් vs මැල් (54 න.නී.වා.91) නඩුවේ සැමියා තම බිරිඳ අනාචාරයේ හැසිරී ඇතියි සැක කළේය. තම නිවසෙන් පිට වී යන ලෙස ඇයට නියෝග කළ සැමියා, අනාචාරය පිළිගනිමින් පාපෝච්චාරණයක් කරන ලෙස බිරිඳට දන්වා සිටියේය. එසේ කරන තුරු බිරිඳ සමඟ සමාදන වීම ද ප්‍රතික්ෂප කර සිටියේය. "

ස්වාමි පුරුෂයාගේ චෝදනාව පදනම් විරහිත බවද ඔහු ද්වේශ සහගත හැරයාමේ වරද සිදුකර ඇති බවද අධිකරණය තීන්දු කළේය.

## දරුවන්ගේ නීත්‍යානුකූල බව

එහි සඳහන් වන්නේ යම් මිනිසෙකු සහ ගැහැණියක අතර වලංගු විවාහයක් පවතින කාලය තුළ උපදින දරුවන් එකී විවාහක පුරුෂයාගේ සුජාත දරුවන් බවය.

එසේම විවාහය අවලංගු වු පසුවත් මව අවිවාහකවය සිටි නම් විවාහය අවලංගු වීමෙන් පසු දින දෙසීය අසුවක් ඇතුළත උපදින ද එකී මිනිසාගේ සුජාත දරුවන් බවය.

එය එසේ නොවන්නේ දරුවා පිළිසිඳ ගනු ලැබිය හැකි කාලය තුළ එකී පුරුෂයා, එකී කාන්තාව සමඟ ලිංගික සම්බන්ධතාවයක් නොපැවැත් වූ බව හෝ පුරුෂයා ලිංගික බෙලහීනතාවයෙන් යුතු වූ බව ඔප්පු කළහොත් පමණි.

## අඹුසැමියන් දෙදෙනා වෙන් වෙන් වෛවාහක වැරදි දෙකක් කර ඇතවිට තත්වය කුමක්ද ?

සහනයක් ඉල්ලා අධිකරණය වෙත එන විට පිරිසිදු දෑත් ඇතිව ආ යුතුය.

**<u>බබුන් නෝනා vs ඇල්බින්</u> (67 න.නී.යා.183) නඩුවේ සිද්ධිය මෙසේය.**

> "බබුන් නෝනා ඇල්බින්ගේ නීතියානුකූල භාර්‍යාව වූ අතර, හීන් හාමිනේ ඇල්බින්ගේ අනියම් භාර්‍යාව විය. හීන් හාමිනේ ඇල්බින්ගේ දරුවකු ප්‍රසූත කළ අවස්ථාවේ දී කෝපයට පත් බබුන් නෝනා ඇල්බින්ට පහර දුන්නාය. තුවාල ලැබූ ඇල්බින්ව රෝහල් ගත කරන ලදී. පසුව බබුන් නෝනා තම ස්වාමි පුරුෂයා වූ ඇල්බින්ව අතහැර ගියාය.
>
> ඇල්බින්ගේ විෂමචාරය නිසා බබුන් නෝනාට නිවස හැරයාමට සිදුවූ අතර ද්වේශ සහගත අතහැර යෑමේ වෛවාහක වරද මත දික්කසාදයක් ඉල්ලා ඇල්බින් විසින් පවරන ලද නඩුව අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

## දිනපතා බීමත්ව නිවසට පැමිණෙන ස්වාමිපුරුෂයා භාර්‍යාව වෙනුවෙන් කළයුතු සියලු යුතුකම් පැහැර හරින අතර සංවාසයේ යෙදීම ද නොකරයි. භාර්‍යාවට ද්වේශ සහගත හැරයාම මත දික්කසාදයක් ලබාගත හැකිද?

අඹුසැමියන් අතර සංවාසය වෛවාහක වරප්‍රසාදයකි. වෛවාහක වරප්‍රසාද ඉටු නොකිරීම මත භාර්‍යාවට දික්කසායදක් ඉල්ලා සිටිය හැකිය.

## අඹුසැමියන් දෙදෙනාගෙන් එක් අයෙකුගේ රෝගී තත්වය නිසා සංවාසයේ යෙදීමට නොහැකි අවස්ථාවක තත්වය කුමක්ද?

වෛවාහක වරප්‍රාසද කඩ කිරීමක් වන්නේ නිරෝගී භාර්‍යාවක හෝ ස්වාමි පුරුෂයකු ඕනෑකමින්ම සංවාසයේ යෙදීම ප්‍රතික්ෂේප කිරීමයි.

විවාහ වූ තරුණ යුවලකගේ ලිංගික ක්‍රියාවලියට ලැබෙන මූලිකත්වය වියපත් යුවලකගේ ලිංගික ක්‍රියාවලියට නොලැබෙන බව ද සිහි තබා ගත යුතුයි.

# ලිංගික බෙලහීනත්වය

මෙය දික්කසාදයක් ලබා ගැනීමට ඔප්පු කළ යුතු කාරනාවන්ගෙන් තවත් එකකි.

අඹුසැමි සංවාසය විවාහයේ මූලික අවශ්‍යතාවයකි. එය ඉටු කළ නොහැකි නම් ඔහු හෝ ඇය විවාහවීම බලවත් වරදකි.

යමෙකු ලිංගික බෙලහීනතාවයෙන් පෙලෙන්නේ නම් වෛද්‍ය ප්‍රතිකාර ලබාගත යුතුය. එය සුව කළ නොහැකි නම් විවාහ වී අහිංසක පක්ෂයක ජීවිතය විනාශ කිරීමට කටයුතු නොකිරීම හොඳ මනුෂ්‍ය ගුණයකි.

## ලිංගික බෙලහීනත්වය යනු කුමක්ද?

මෙයින් අදහස් කරන්නේ සංවාසයේ යෙදීමට නොහැකියාවයි.

ලිංගික බෙලහීනතාව කායික හෝ මානසික රෝගී තත්වයකි.

සමහරු තමන්ගේ ලිංගික බෙලහීනතාව දැන දැනම විවාහ වෙති. එවැනි පුද්ගලයෝ තමන්ට ද සමාජයට ද ඉමහත් හානියක් සිදු කරයි.

එය තමන්ට වාහනයක් පැදවිය නොහැකි බව දැන දැනම වාහනයක් පැදවීමට ඉදිරිපත් වීමක් වැනිය.

## ලිංගික බෙලහීනත්වය වෛද්‍ය ප්‍රතිකාර මගින් සුවකර ගත හැකිද?

අධිකරණය දික්කසාදයක් ලබා දෙන්නේ විවාහ වන අවස්ථාවේ බෙලහීනතාවක් තිබූ විටය. එපමණක් නොව, එය සුව කළ නොහැකි විය යුතුය. විවාහයෙන් පසු ඇති වූ ලිංගික බෙලහීනතාවන් මත දික්කසාදයක් ඉල්ලා සිටිය නොහැකිය. ලිංගික බෙලහීනතාව සමහර විට මානසික දුර්වලතාවක් නිසා ඇතිවිය හැකිය. සුදුසු වෛද්‍ය ප්‍රතිකාර ගැනීමෙන් එය සුවපත් කර ගත හැකිය.

## ස්වාමිපුරුෂයාගේ ලිංගික බෙලහීනත්වය ඔප්පු කරන්නේ කෙසේද ?

ලිංගික බෙලහීනතාව වෛද්‍ය සාක්ෂි මගින් ඔප්පු කළ හැකිය. පුරුෂයා වෛද්‍ය පරීක්ෂණයකට භාජනය වීම ප්‍රතික්ෂේප කරන විටක ඔහුගේ බෙලහීනතාව සම්බන්ධ පූර්ව නිගමනයක් කරනු ලැබේ. විවාහ වී සෑහෙන කාලයක් ගත වූ පසුවත් භාර්යාව කන්‍යාවක් නම් පුරුෂයාගේ ලිංගික බෙලහීනතාව ඔප්පු කිරීමට පහසු වේ.

## ලිංගික බෙලහීනතාව පුරුෂයන්ට පමණක් විශේෂිත වූ රෝගී තත්ත්වයක් ද?

නැත. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම ලිංගික බෙලහීනතාව පවතින නමුත් දික්කසාද නඩුවලදී නම් වැඩිපුර එළිදරව් වෙන්නේ පුරුෂයාගේ බෙලහීනතාවයයි.

## දෙදෙනාගේ කැමැත්ත මත දික්කසාදයක් ලබා ගැනීම


උඩරට නීතිය යටතේ විවාහ වූ අයට දෙදෙනාගේ කැමැත්ත මත දික්කසාද වීමට පුළුවනි.

එහෙත් සාමාන්‍ය විවාහ නීතිය යටතේ දෙදෙනාගේ කැමැත්ත මත දික්කසාදයක් ලබා ගැනීමට නීතියෙන් ඉඩ නොමැති කම බැලූ බැල්මට අසාධාරණ බව පෙනී යයි.

> “එනම් සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ විවාහ වූ ස්වාමි පුරුෂයෙකුට හා භාර්යාවකට දෙදෙනාගේ කැමැත්ත මත දික්කසාද නඩු තීන්දුවක් ලබාගත නොහැකිය.”

එහෙත් බිරිඳ දික්කසාද නඩුවක් පැවරූ විට ස්වාමි පුරුෂයාට සිතාසි ලැබුන පසුව ඔහුට අධිකරණය වෙත පැමිණීමෙන් වැළකී සිටිය හැකිය. නමුත් වඩාත් සුදුසු වන්නේ අධිකරණය වෙත පැමිණ උත්තර ඉදිරිපත් නොකරන බව දන්වා සිටීමයි. එවිට නඩුව ඒකපාක්ෂිකව පැමිණිලිකරුගේ /පැමිණිලිකාරියගේ සාක්ෂි මත නඩු තීන්දුවක් දෙනු ලැබේ.

එවැනි අවස්ථාවක බිරිඳ ඉල්ලා ඇති පරිදි අධිකරණය විසින් දික්කසාදයක් ලබා දෙනු ලැබේ. දෙදෙනා එක්ව කැමැත්ත ප්‍රකාශ නොකළත් මේ ආකාරයට කැමැත්තෙන් දික්කසාද විය හැකිය.



## දික්කසාද දීමනාව

- තාවකාලික දික්කසාද දීමනාව
- ස්ථිර දික්කසාද දීමනාව

### තාවකාලික දික්කසාද දීමනාව යනු කුමක්ද?

දික්කසාද නඩුව පැවරුවේ ස්වාමි පුරුෂයා හෝ භාර්යාව වුව ද නඩුව පවතින අතර ඇයගේ නඩත්තුව සඳහා භාර්යාවට තාවකාලික දික්කසාද දීමනාවක් ඉල්ලා සිටිය හැකිය.

### ස්ථිර දික්කසාද දීමනාව යනු කුමක්ද?

දික්කසාද තීන්දුවකින් අහිංසක පක්ෂයට ස්ථිර දික්කසාද දීමනාවක් ලබාගත හැකිය.

### තාවකාලික දික්කසාද දීමනාවක් භාර්යාවගෙන් ස්වාමිපුරුෂයාට ලබා ගත හැකි ද?

සත්තකින්ම ඔව්.

### තාවකාලික දික්කසාද දීමනාව ලබා ගන්නේ කෙසේද ?

මෙයට අදාළ නීතිය සිවිල් නඩු විධාන සංග්‍රහයේ 614 වන වගන්තියේ සඳහන්ය. දික්කසාද නඩුව පවතින අතරතුර දික්කසාද දීමනාව ලබා ගැනීම දික්කසාද නඩුවේ තීන්දුවට විරුද්ධව අභියාචනය කළහොත් අභියාචනා නඩුවේ තීන්දුව ලැබෙන තුරු තාවකාලික දික්කසාද දීමනාව ගෙවිය යුතුය.

### ස්වාමිපුරුෂයාට විරුද්ධව දික්කසාද තීන්දු ප්‍රකාශයක් ප්‍රකාශ කිරීමේ දී භාර්යාව වෙත ලබාදෙන වෙනත් ප්‍රදාන මොනවාද ?

මේ සම්බන්ධව සිවිල් නඩු විධාන සංග්‍රහයේ 615 වන ඡේදයේ විස්තර කර ඇත.

දික්කසාද තීන්දුවකදී අධිකරණයට පහත සඳහන් නියෝග ඇතුලත් කළ හැකිය.

1. ස්වාමිපුරුෂයාට හිමි දේපලක් හෝ කොටසක් භාර්යාවට සහ දරුවන්ට ලබාදීම.

2. ස්වාමිපුරුෂයාට අයිති යම් මුදල් ප්‍රමාණයක් භාර්යාවට සහ දරුවන්ට ලබාදීම.

3. යුක්ති සහගත යයි අධිකරණය කල්පනා කරන යම් මුදල් ප්‍රමාණයක වාර්ෂිකව හෝ මාසිකව භාර්යාවට හා දරුවන්ට ගෙවන ලෙස ස්වාමිපුරුෂයාට නියෝග කිරීම. නමුත් බොහෝ නඩුවල සිදුවන්නේ දෙපාර්ශවයේ එකඟතාවයෙන් ප්‍රමාණවත් මුදලක් එක්වර ගෙවීමකි.

4. ස්වාමිපුරුෂයාගේ දේපලක් බැඳුම්කරයකට බැඳ තැබීම. විවාහයේ දරුවන් නැති විට භාර්යාවගේ වාසියට පමණක් ඉහත සඳහන් නියෝග නිකුත් කළ හැකිය.

ඉහත 615 වන ඡේදයේ යටතේ කරනු ලබන ප්‍රදානයන් ස්ථිර දික්කසාද දීමනාවක් නම් වේ.

**ස්වාමි පුරුෂයා, භාර්‍යාවට විරුද්ධව දික්කසාද නඩු තීන්දුවක් ලබාගන්නා අවස්ථාවකදී ඔහුට ඇයගෙන් ස්ථිර දික්කසාද දීමනාවක් ලබාගත හැකි ද?**

සත්තකින්ම පුළුවන්. නීතිය හැම දෙනාටම සාධාරණයි.

## උඩරට නීතිය යටතේ දික්කසාදය

මෙම නීතිය යටතේ දික්කසාද තීන්දුවක් ලබා ගැනීමට හේතු 5ක් යටතේ හැකියාව ඇත.

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| විවාහයෙන් පසු බිරිඳ අනාචාරයේ හැසිරීම | සැමියාගේ දැඩි කෲරත්වය හෝ අනාචාරයේ හැසිරීම | අඛණ්ඩව දෙවසරක් පුරා බිරිඳ හෝ සැමියා විසින් අනෙක් පාර්ශවය අතහැර දමා තිබීම | සතුටින් එකට ජීවත් වීමේ නොහැකියාව | අන්‍යෝන්‍ය කැමැත්ත |

උඩරට නීතිය යටතේ දික්කසාදයක් සඳහා ඉල්ලීම කළ යුත්තේ ප්‍රදේශයේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙතය (ප්‍රාදේශිය ලේකම්).

## තේසවළමේ නීතිය යටතේ දික්කසාද වීම

තේසවළමේ නීතිය බලපවත්වන ද්‍රවිඩ අයට ද රටේ පොදු නීතිය බලපායි.

## මුස්ලිම් නීතිය යටතේ දික්කසාද වීම

"මේ යටතේ අධිකරණයෙහි මැදිහත් වීමකින් තොරව ඕනෑම අවස්ථාවක කිසිඳු හේතුවක් නොදක්වා තෙවරක් **තලාක්** යන වචනය ප්‍රකාශ කිරීමෙන්ම දික්කසාදය ලබා ගත හැක."

තමා මේ ආකාරයෙන් දික්කසාද කිරීමට අදහස් කරන්නේ නම් ඒ බව පළාතේ කාතී වෙත දැනුම් දිය යුතුය. එහිදී කාතී විසින් සමාදන කිරීමට උත්සාහ කරන අතර, නොහැකි වුවහොත් සැමි-යාගේ තලාක්, ප්‍රකාශය සටහන් කර එය ලියාපදිංචි කර බිරිඳට දැනුම් දිය යුතුය. නමුත් වර්තමානයේ කාතී වෙත දැනුම් නොදී කෙටි පණිවිඩයක් (SMS) මඟින්ද දික්කසාද විය හැකි.

## වාසයෙන් සහ සංවාසයෙන් වෙන්වීම සඳහා වූ නඩු

මෙය තවත් වෛවාහක සහනයකි. වාසයෙන් සහ සංවාසයෙන් වෙන්වීමක් මඟින් අඹුසැමි සබඳතාව තාවකාලිකව නතර වේ. දෙදෙනා නැවත සංවාසය ඇරඹූ විට විවාහය යථා තත්ත්වයට පත්වේ.

### වාසයෙන් සහ සංවාසයෙන් වෙන්වීම සඳහා වූ නඩුවක් දික්කසාද නඩුවකින් වෙනස් වන්නේ කෙසේද?

දික්කසාද නඩුවකින් විවාහය විසුරුවා හරිනු ලැබේ. වාසයෙන් සහ සංවාසයෙන් වෙන් වීමේ නියෝගයක් මඟින් සිදුවන්නේ විවාහය තාවකාලිකව අත්හිටුවීමක් පමණකි.

මේ සම්බන්ධ නීතිය සිවිල් නඩු විධාන සංග්‍රහයේ 608 වන වගන්තියේ සඳහන්ය. කිසියම් හේතුවක් නිසා දික්කසාදයක් ලබා ගැනීමට අකමැති ස්වාමි පුරුෂයාට හෝ භාර්යාවකට නීතියෙන් ලබාගත හැකි සහනයක් ලෙස මෙම ක්‍රියාවලිය විස්තර කළ හැකිය. මෙවැනි නියෝගයකින් විවාහයක් අවසන් නොවේ. අඹුසැමියන්ට අවශ්‍ය නම් වෙන්වී සිටින නිසා සංවාසයේ යෙදීමක් සිදු නොවුනත්, අනෙකුත් වරප්‍රසාද ඉටු කිරීමට බැඳී ඇත.

## වාසයෙන් සහ සංවාසයෙන් වෙන්වීමේ නියෝගයක් ලබා ගත හැක්කේ කුමන වැරදි මත ද?

දික්කසාදයක් ලබාගත හැකි විවාහයෙන් පසු අනාචාරයේ හැසිරීම, ද්වේශ සහගතව අත්හැරයාම සහ විවාහ වන අවස්ථාවේදී තිබූ සුවකළ නොහැකි ලිංගික බෙලහීනතාව යන වෛවාහක වැරදි තුන මත මෙන්ම කෲරකම මතද වාසයෙන් සහ සංවාසයෙන් වෙනවීමේ නියෝගයක් ලබාගත හැකිය.

## වාසයෙන් සහ සංවාසයෙන් වෙන්වීමේ නියෝගයක් ලබා ගැනීමෙන් පසුව එය අවලංගු කරවා ගැනීමට පුළුවන් ද?

ඔව්. අධිකරණයට ඉල්ලීමක් කර අවලංගු කර ගැනීමට පුළුවන.

## වාසයෙන් සහ සංවාසයෙන් වෙන්වීමේ නියෝගයක් ලබා ඇතිවිට දික්කසාදයක් ලබාගැනීම සඳහා වෙනත් නඩුවක් පැවරිය යුතුද?

ඔව්. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 608 (2) වගන්තිය අනුව.

**1**

වාසයෙන් සහ සංවාසයෙන් වෙන්වීම සඳහා තීන්දු ප්‍රකාශය වාර්තා කිරීමෙන් අවුරුදු 2ක කාලයක් ඉකුත් වීමෙන් පසු.

**2**

එවැනි තීන්දු ප්‍රකාශයක් නැතිව වුවත් අවුරුදු 7ක කාලයක් වාසයෙන් සහ සංවාසයෙන් වෙන් වීමක් තිබුණු අවස්ථාවක දික්කසාදය සඳහා ඉල්ලීමක් කළ හැකිය.

## වාසයෙන් සහ සංවාසයෙන් වෙන්වීම සඳහා වන නඩු උසාවියේ නිතර දක්නට ලැබෙනවාද ?

මෙවැනි නඩු නැත්තටම නැති තරම්ය.

# LAC මධ්‍යස්ථාන
# පිහිටි ස්ථාන

| | | | |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 011-2433618 | මන්නාරම | 023-2222045 |
| අක්කරෙයිපත්තු | 067-2279462 | මාරවිල | 032-2254443 |
| අම්පාර | 063-2223495 | මාතලේ | 066-2224828 |
| අනුරාධපුර | 025-2224465 | මාතර | 041-2233815 |
| අත්තනගල්ල | 033-2297020 | මතුගම | 034-2249262 |
| අවිස්සාවේල්ල | 036-2233857 | මාවනැල්ල | 035-2247272 |
| බද්දේගම | 091-2292051 | මිනුවන්ගොඩ | 011-2297790 |
| බදුල්ල | 055-2225759 | මොණරාගල | 055-2276891 |
| බලංගොඩ | 045-2289099 | ගල්කිස්ස | 011-2718708 |
| බලපිටිය | 091-2255753 | මුලතිවු | 021-2290077 |
| බණ්ඩාරවෙල | 057-2224733 | මුයිතූර් | 026-2238777 |
| බත්තරමුල්ල | 011-2877687 | නාවලපිටිය | 054-2224227 |
| මඩකලපුව | 065-2225399 | මීගමුව | 031-2281080 |
| චාවකච්චේරිය | 021-2270882 | නිකවැරටිය | 037-2260203 |
| හලාවත | 032-2222175 | නුගේගොඩ | 011-2809068 |
| දඹුල්ල | 066-2284551 | නුවරඑළිය | 052-2235260 |
| දෙයියන්දර | 041-2268077 | පානදුර | 038-2244822 |
| දෙනියාය | 041-2271128 | පේදුරුතුඩුව | 021-2260212 |
| ඇඹිලිපිටිය | 047-2230299 | පොල්ගහවෙල | 037-2243039 |
| ගල්ගමුව | 037-2253290 | පොළොන්නරුව | 027-2226572 |
| ගාල්ල | 091-2226124 | පොතුවිල් | 063-2248485 |
| ගම්පහ | 033-2248804 | පුගොඩ | 011-2405333 |
| හම්බන්තොට | 047-2221092 | රත්නපුර | 045-2226899 |
| හැටන් | 051-2222390 | තංගල්ල | 047-2240122 |
| හිඟුරක්ගොඩ | 027-2245521 | තඹුත්තේගම | 025-2276259 |
| හෝමාගම | 011-2748813 | තිස්සමහාරාමය | 047-2239611 |
| හොරණ | 034-2265244 | ත්‍රිකුණාමලය | 026-2226328 |
| යාපනය | 021-2224545 | වාලච්චේනයි | 065-2258349 |
| කඩවත | 011-2922440 | වව්නියාව | 024-2221863 |
| කඩුවෙල | 011-2548150 | වලස්මුල්ල | 047-2245566 |
| කැකිරාව | 025-2263536 | වැල්ලවාය | 055-2274466 |
| කල්මුනේ | 067-2223710 | වරකාපොළ | 037-2277075 |
| කළුතර | 034-2222017 | වාරියපොල | 037-2268199 |
| මහනුවර | 081-2388978 | වැලිමඩ | 057-2244860 |
| කන්තලේ | 026-2234521 | මල්ලකම් | 021-2059170 |
| කැබිතිගොල්ලැව | 025-2298101 | පුත්තලම් | 032-2266636 |
| කෑගල්ල | 035-2231790 | සියඹලාණ්ඩුව | 055-2279250 |
| කිලිනොච්චි | 021-2285618 | දෙහිඅත්තකණ්ඩිය | 027-2250700 |
| කුලියාපිටිය | 037-2284611 | LT-බොරැල්ල | 011-2698003 |
| කුරුණෑගල | 037-2229641 | ගලගෙදර | 081-2061025 |
| මහියංගනය | 055-2258332 | වත්තල | 011-2935907 |
| මාහෝ | 037-2275075 | හෙට්ටිපොල | 037-2291915 |

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

නො.129, මහාධිකරණ සංකීර්ණය,
හල්ෆ්ට්ස්ඩෝර්ප් වීදිය, කොළඹ 12.

011 2433618

legalaidcommission1978@gmail.com

www.legalaid.gov.lk

